# සංක්ෂිප්තය


දේශීය අල ගොවීන්ගේ සමාජ-ආර්ථික තත්ත්වය පිළිබඳ විමර්ශනය කරමින් අතිරේක ආහාර බෝග වශයෙන් දේශීය අල වගාව ප්‍රචලිත කිරීමට ඇති විභවතා සහ බාධක හඳුනා ගැනීම මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ විය.අනෙකුත් විශේෂිත අරමුණු වූයේ, දැනට නිෂ්පාදනය කරන අල වර්ග සහ ඒවායේ පරිභෝජන රටාව හඳුනාගැනීම,අල වගාවේ හඳුනාගත් බෝග සඳහා නිෂ්පාදන වියදම ගණනය කිරීම, වගාවෙ තිරසරභාවය හා බැඳුණු සාධක විශ්ලේෂණය කරමින් දේශීය අල බෝග ආරක්ෂා කිරීමට හා නිෂ්පාදනය වැඩි දියුණු කිරීමට යෝජනා හා නිර්දේශ ඉදිරිපත් කිරීමයි.

මෙම අධ්‍යයනයේ දත්ත රැස් කිරීම සඳහා දේශීය අල වගාව බහුලව සිදු කරන දිස්ත්‍රික්ක අතුරින්අධ්‍යයන ප්‍රදේශ වශයෙන් කුරුණෑගල, කෑගල්ල සහ ගම්පහ යන දිස්ත්‍රික්ක තෝරා ගන්නා ලදි.එක් දිස්ත්‍රික්කයකින් දේශීය අල වගා කරන ගොවීන් 60දෙනෙකුට නොඅඩු වන සේ නියැදියක් අධ්‍යයනයට භාජනය කරන ලදි.මේ අනුව ගම්පහ දිස්ත්‍රික්කයේ ගොවීන් 63ක් කෑගල්ල දිස්ත්‍රික්කයේ ගොවීන් 64ක් හා කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවීන් 65ක් ලෙස සම්පූර්ණ නියැදිය ගොවීන් 192ක් විය.

අධ්‍යයනයේ සොයා ගැනීම්වලට අනුව,ගොවීන් අතරින් 82 ක් වයස අවුරුදු 45 ඉක්මවූවන් වන අතර සමස්ත නියැදියේ 72%ක් පරිභෝජනය සඳහා පමණක් අල බෝග වගා කර ඇත. මේ අනුව පෙනී යන්නේ පාරම්පරික වශයෙන් ගොවිතැනේ නියැලුණු ගොවිජනතාව ප්‍රධාන වශයෙන් පරිභෝජනය සඳහා අල වගා කරනු ලබන බවයි. පරිභෝජන අවශ්‍යතා සපුරා ගැනීම සඳහාවත් අල බෝග වගා කිරීම කෙරෙහි තරුණ ගොවි ජනතාව යොමු වීමේ ප්‍රවණතාව අඩු මට්ටමක පවතී.

උදෑසන ආහාරය (63%) හෝ දිවා ආහාර (46%) ලෙස ආහාරයට ගැනීම අල පාරිභෝජන රටාවේ දක්නට ලැබුන සුවිශේෂතාවකි. රාත්‍රී ආහාරයක් ලෙස අල බෝග භාවිතා කර ඇත්තේ නියැදියේ 2% කි. අල බෝග පාරිභෝජනය සම්බන්ධයෙන් ජනතාව අතර පවතින ආකල්ප හා අඩු මිලකට අර්තාපල් මිලදී ගත හැකි වීම දේශීය අල පාරිභෝජනය ඉහළ නැංවීම සඳහා බාධකයන් වී ඇත.

අල බෝග වගාව ප්‍රචලිත කිරීම සම්බන්ධයෙන් දැනට කෑගල්ල දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක වන රාජ්‍ය හා පෞද්ගලික සංවිධාන සැලකිය යුතු මෙහෙයක් ඉටු කරමින් පවතී. එම ආයතන දියත් කරනු ලබන බීජ බැංකු ක්‍රමය අල වගාව නගා සිටුවීම සඳහා කාලෝචිත ක්‍රමවේදයකි.

අල බෝග වගාව ගොවීන් අතර ප්‍රචලිත කිරීම සඳහාත්, ඒවා වඳවී යාම වැළැක්වීම සඳහාත්,ගොවිජන සේවා මධ්‍යස්ථානවල එම ප්‍රදේශවලට ආවේණික අල වර්ගවල ආදර්ශ වගාවන් පවත්වා එමඟින් ගොවීන් දේශීය අල වගාවට යොමු කරවීම හා දිරිමත් කිරීම කළ යුතුය. තවද කෑගල්ල දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක වන පරිදි රාජ්‍ය-පෞද්ගලික ආයතනවල සහභාගිත්වයෙන් එක් ගමකට එක් ආදර්ශ ගෙවත්තක් සකස් කර අනෙකුත් ගොවීන්ට අවශ්‍ය බීජ ලබා දෙන මධ්‍යස්ථානයක් ලෙස එය සංවර්ධනය කර බීජ බැංකු ක්‍රමය හඳුන්වා දීම තුළින් අල වගාව ප්‍රචලිත කිරීමට හැකිවනු ඇත. තවද අල බෝගවල නිෂ්පාදකතාව ඉහළ නැංවීම සඳහා සුදුසු පර්යේෂණ දියත් කර වැඩි දියුණු කළ ප්‍රභේද ගොවීන්ට හඳුන්වාදීම වැදගත්ය.

අල බෝග පාරිභෝජනය ඉහළ නැංවීම සඳහා අල වල ඖෂධීය හා පෝෂණීය ගුණය පිළිබඳව ජනතාව හා විශේෂයෙන් පාසල් දරුවන් දැනුවත් කිරීම, අල බෝග ආශ්‍රිත අතුරු නිෂ්පාදන පිළිබඳ සාම්ප්‍රදායික දැනුම ලේඛනගත කිරීම හා එම නිෂ්පාදන ජනතාව අතර ප්‍රචලිත කිරීම,අපනයනකරුවන් දිරිමත් කිරීම සඳහා අපනයන වෙළෙඳපොළ තුළ පවතින ඉඩ ප්‍රස්ථා පිළිබඳ දැනුවත් කිරීමට පියවර ගැනීම වැදගත් වේ.